# Gap Inc.

# ව්‍යාපාරික චර්යාධර්ම පද්ධතිය

**මෙම ව්‍යාපාරික චර්යාධර්ම පද්ධතිය Gap Inc. සඳහා හෝ වෙනත් එහි උප ආයතන, අනුබද්ධ ආයතන සහ නියෝජිතයන් සඳහා භාණ්ඩ නිපදවන සියලු කර්මාන්ත ශාලාවලට අදාළ වේ.**

ලොව පුරා කර්මාන්ත ශාලා ක්‍රියාත්මක වන විවිධ නෛතික හා සංස්කෘතික පරිසරයන් තිබෙන බව Gap Inc. දැන සිටින අතර මෙම චර්යාධර්ම පද්ධතිය මඟින් ඉදිරිපත් කරනු ලබනුයේ Gap Inc. සමඟ ව්‍යාපාරික කටයුතු සිදු කිරීමේදී සියලුම කර්මාන්ත ශාලා විසින් සපුරාලිය යුතු මූලික අවශ්‍යතාවන්ය. මෙම චර්යාධර්ම පද්ධතිය අන්තර්ජාතික කම්කරු සංවිධානයේ මූලික ප්‍රඥප්ති සහ ලෝක මානව හිමිකම් ප්‍රකාශනය ඇතුළුව ජාත්‍යන්තරව පිළිගත් අන්තර්ජාතික ප්‍රමිතීන් මත පදනම් වී තිබේ. මෙම චර්යාධර්ම පද්ධතියෙන් Gap Inc. හි අඛණ්ඩව කර්මාන්තශාලාවන්හි සේවා නියුක්ත කරවීමේ කටයුතු සහ පාරිසරික අනුකූලතාවය සඳහා වන පදනම සැපයේ.

## I. නීති හා අනුකූල වීම

Gap Inc. සඳහා භාණ්ඩ නිපදවන සියලු කර්මාන්ත ශාලා අදාළ රටවල නීති සහ අනෙකුත් අදාළ නීති, රීති සහ රෙගුලාසිවලට පූර්ණව අනුකූල අන්දමින් කටයුතු කරනු ලැබේ. Gap Inc. සමඟ ව්‍යාපාර කටයුතු කිරීමේ කොන්දේසියක් ලෙස සෑම ව්‍යාපාරිකයෙකුම මෙම චර්යාධර්ම පද්ධතිය හා අනුකූලව කටයුතු කළ යුතුය. මෙම අනුකූලතාව තක්සේරු කිරීමට සහ අනුකූල වන බවට සහතික කිරීමට Gap Inc. සමාගම ඇගයීම් සහ පිළියම් යෙදීමේ ක්‍රමයක් සංවර්ධනය කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ඇත. දේශීය නීතිය සහ Gap Inc. නීතිය එනම් COVC, තුළ ක්‍රියාත්මක නීතිය අතර කිසියම් වෙනසක් තිබේ නම්, වඩා දැඩි නීතිය අදාළ කර ගත යුතුය. ව්‍යාපාරිකයන් සහ ව්‍යාපාරික අනුබද්ධ ආයතන භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගත යුත්තේ Gap Inc. විසින් අනුමත කරන ලද කර්මාන්තශාලා පමණි. නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර ව්‍යාපාරිකයන් විසින් මෙම කර්මාන්තශාලා යොදා ගැනීම සඳහා වන පූර්ණ ලිඛිත අවසරය Gap Inc. වෙතින් ලබා ගත යුතුය.

## II. පරිසරය

කර්මාන්ත ශාලා සියලු අදාළ පාරිසරික නීති හා රෙගුලාසි අනුව කටයුතු කරනු ලබයි. එවැනි අවශ්‍යතා Gap Inc. හි අවශ්‍යතාවලට වඩා දුර්වල වන විට Gap Inc. හි පාරිසරික මූලධර්ම තුළ දක්වා ඇති ප්‍රමිතීන් සපුරාලන ලෙසට කර්මාන්ත ශාලා දැඩිව දිරිමත් කෙරේ. කර්මාන්තශාලා බලශක්තිය සහ හරිතාගාර වායු විමෝචන (GHG) , වායු දූෂණය (වාතය තුළට සිදු කෙරෙන විමෝචන), ජල පරිභෝජනය, ජලයේ ගුණාත්මකභාවය, අප ජලය, අපද්‍රව්‍ය හැරවීම සහ බැහැර කිරීම, රසායනික ද්‍රව්‍ය භාවිතය සහ හැසිරවීම ඇතුළුව පරිසරය කෙරෙහි සිය බලැම් කළමනාකරණය කරගත යුතුය.

## III. ශ්‍රමය

### A. ළමා ශ්‍රමය

කර්මාන්තශාලාවල සේවයෙහි නියුක්ත කරවිය යුත්තේ අදාළ අවම නෛතික වයස් අවශ්‍යතාවය සපුරාලන හෝ අඩු තරමින් වයස අවුරුදු 15ට වඩා වැඩි හෝ යන මේ දෙකෙන් වැඩි තැනැත්තන්ය. එසේම කර්මාන්ත ශාලා අදාළ අනෙකුත් ළමා ශ්‍රමය හා අදාළ නීතිවලට අනුකූල විය යුතුයි. සහභාගී වන සියලු සේවකයින් අවුරුදු 15 අවම වයස් සීමාව සහ අවම නෛතික වයස් අවශ්‍යතාවය සපුරා තිබේ යන උපකල්පනය මත පිහිටා තම සේවකයන්ගේ අධ්‍යාපනික ප්‍රතිලාභ සඳහා නෛතික සේවා ස්ථාන ආධුනිකත්ව වැඩසටහන් සංවර්ධනය කිරීම පිණිස කර්මාන්ත ශාලා දිරි ගන්වනු ලැබේ.

### B. විදේශීය කොන්ත්‍රාත් ශ්‍රමය

විදේශීය කොන්ත්‍රාත් සේවකයන් බඳවා ගනු ලබන හෝ සේවයේ නියුක්ත කරවනු ලබන කර්මාන්තශාලා එම සේවකයින්ට එහි දේශීය සේවකයින්ට සමාන ආකාරයෙන් සහ සාධාරණ ආකාරයෙන් සලකනු ලබන බවට වග බලා ගත යුතුය. සංක්‍රමණික සේවකයන් කිසිදු ආකාරයක බලහත්කාර, අනිවාර්ය, බැඳුම්ගත, හෝ ණය ගෙවීම් සඳහා ලබා දෙන ශ්‍රමය භාවිතා නොකළ යුතුය. සියලුම වැඩ සිය කැමැත්තෙන් ලබා දිය යුතු අතර සේවකයන්ට ඕනෑම අවස්ථාවක දඩ මුදල් නොගෙවා සිය සේවය අවසන් කිරීමේ නිදහස තිබිය යුතුය. සංක්‍රමණික සේවකියන්ට (හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට) රැකියාව භාර ගැනීමට බල කිරීම පිණිස හෝ කිසිදු දඩ මුදලක් ගෙවීමකින් තොරව, ඕනෑම අවස්ථාවක සිය කැමැත්තෙන් සිය සේවය අවසන් කිරීම වැළැක්වීම පිණිස බලධාරීන් වෙත පැමිණිලි කරන බවට තර්ජනය නොකළ යුතුය.

### C. වෙනස් කොට සැලකීම

කර්මාන්තශාලා විසින් සේවකයින් සේවයෙහි නියුක්ත කරවිය යුත්තේ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා ඔවුන් සතුව ඇති හැකියාව පදනම් කර ගෙන විය යුතු අතර ඔවුන්ගේ පෞද්ගලික හේතුකාරණා හෝ විශ්වාසයන් සැලකිල්ලට ගෙන නොවේ.

### D. බලෙන් යොදා ගනු ලබන ශ්‍රමය

කර්මාන්තශාලා විසින් කිසිදු ආකාරයක සිය කැමැත්තෙන් තොරව ලබා දෙන ශ්‍රමය භාවිතා නොකළ යුතුය. ඊට බන්ධනාගාරගත වූ අයගේ ශ්‍රමය, ණය බැඳුම්කරය, වහල් ශ්‍රමය හෝ රජය විසින් බලහත්කාරයෙන් යොදවන ශ්‍රමය ඇතුළත් වේ.

### E. සංගමයේ නිදහස සහ සාමූහිව ඉල්ලා සිටීමේ නිදහස

කම්කරුවන්ට තමාගේ මනාපය පරිදි සංගමයකට බැඳීමේ නිදහස තිබේ. නිත්‍යානුකූලව සහ සාමකාමීව හමු වීම, සංවිධානය වීම හෝ සාමූහික වශයෙන් ඉල්ලා සිටීමේ නිදහසට කර්මාන්ත ශාලා බාධා නොකරනු ලබයි. එසේ කරන්නේද නැත්ද යන්න පිළිබඳ සම්පූර්ණ නිදහස සේවකයන්ට තිබේ.

### F. මානුෂිකව සැලකීම

කර්මාන්ත ශාලා විසින් සියලු සේවකයන්ට ගෞරවණීය ලෙස සැලකිය යුතුය. කර්මාන්ත ශාලා කිසි විටෙකත් ශාරීරික දඬුවම් හෝ වෙනත් ශාරීරික හෝ මානසික බලපෑම් කිරීමක් සිදු නොකළ යුතුය.

### G. වේතන සහ ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීම

සියලු අදාළ නීති අනුව කර්මාන්තශාලා වේතන සහ අතිකාල දීමනා ගෙවිය යුතුය. සේවකයන්ට අඩු වශයෙන්ම අවම වේතනය හෝ දේශීය කර්මාන්ත ප්‍රමිති සපුරාලන වැටුප යන මේ දෙකෙන් වැඩි මුදල ගෙවිය යුතුය. සේවකයන්ගේ මූලික අවශ්‍යතාවයන් සහ වුවමනාවන් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් තරමක ආදායමක් සපයා ගත හැකි වේතන හා ප්‍රතිලාභ කර්මාන්ත ශාලා විසින් සේවකයන්ට ගෙවිය යුතු බව සැමවිටම දිරිමත් කරනු ලැබේ.

### H. වැඩ කරන පැය ගණන

සියලු අදාළ නීති අනුව කර්මාන්තශාලා වැඩ කරන පැය ගණන සකස් කළ යුතුය. ඇඟළුම් නිෂ්පාදනයේදී අතිකාල කිරීම අවශ්‍ය වන බව තේරුම් ගන්නා අතර, මානුෂික සහ ඵලදායි සේවා තත්වයක් තහවුරු කළ හැකි මට්ටමක් දක්වා නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ආකාරයෙන් කර්මාන්තශාලා ඒවායෙහි සේවා කාලයන් සීමා කළ යුතුය.

## IV. සේවා තත්වයන්

### A. වෘත්තීයමය සෞඛ්‍ය සහ ආරක්ෂාව

සේවා තත්වයන් සම්බන්ධ සියලු අදාළ නීති සහ රෙගුලාසි අනුව කර්මාන්ත ශාලා කටයුතු කරනු ලබන අතර සේවකයන් සඳහා ආරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සලසා තිබිය යුතුය.

### B. නේවාසිකාගාර (අදාළ වේ නම්)

තම සේවකයන්ට නේවාසිකාගාර සපයන කර්මාන්ත ශාලා එම පහසුකම් පිරිසිදුව සහ ආරක්ෂාකාරීව තබා ගත යුතුය.

## V. කළමනාකරණ ක්‍රම

අදාල නීති රීති, රෙගුලාසි සහ COVC සමඟ අනුකූල වන බවට සහතික වනු පිණිස කර්මාන්තශාලා විසින් යෝග්‍ය මෙහෙයුම් පාලනයන් සහිතව සැලසුම් කරන ලද තිරසාර කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර ගත යුතුය. කළමනාකරණ ක්‍රම මඟින් තිරසාරත්ව අවදානම් හඳුනා ගෙන පාලනය කරනු ලබන අතර අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීමද සිදු කරනු ඇත.

GAP BANANA REPUBLIC OLD NAVY ATHLETA